42733

AL/2019/32/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.08 / 0830 - 1030

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ...............................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** ව්‍යාපාර විකාශනයේ අවධි හතර පහත දැක්වේ.

A - කාර්මික විප්ලවය　　B - මුදල් භාවිතය

C - භාණ්ඩ හුවමාරුව　　D - තොරතුරු ආර්ථිකය

ඉහත සඳහන් ව්‍යාපාර විකාශනයේ අවධි නිවැරදිව අනුපිළිවෙළට දක්වා ඇති වරණය තෝරන්න.

(1) A, C, D, B　(2) B, A, C, D　(3) B, D, A, C　(4) C, A, B, D　(5) C, B, A, D　(......)

**2.** සමාජීය හා සංස්කෘතික පරිසරයට අයත් මූලිකාංග නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) විශ්වාස, අගනාකම්, තාක්ෂණය හා සම්මත
(2) අගනාකම්, ආයතන, වයස් ව්‍යුහ හා සම්ප්‍රදායන්
(3) සිරිත් විරිත්, අගනාකම්, සංවිධාන ව්‍යුහ හා සම්ප්‍රදායන්
(4) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා රෙගුලාසි
(5) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා සම්ප්‍රදායන්　(......)

**3.** පහත වගුවේ සාර්ව පරිසර මූලිකාංග සහ ඊට අදාළ සිද්ධීන් කිහිපයක් දක්වා ඇත.

| මූලිකාංග | සිද්ධීන් |
|---|---|
| (i) ආර්ථික | A - දේශගුණික තත්ත්වයන් වෙනස්වීම |
| (ii) ස්වාභාවික | B - නව කම්කරු නීතිරීති බලගැන්වීම |
| (iii) තාක්ෂණික | C - නව නිෂ්පාදන ක්‍රමයක් සොයා ගැනීම |
| (iv) නෛතික | D - විදේශ විනිමය අනුපාතය වෙනස් වීම |

ඉහත දී ඇති මූලිකාංග අනුපිළිවෙළ අනුව සිද්ධීන් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D　(2) B, D, C, A　(3) C, A, B, D　(4) C, D, B, A　(5) D, A, C, B　(......)

**4.** තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A - තාක්ෂණික සංවර්ධනය　　B - සේවක සුභසාධනය

C - පරිසර හිතකාමී නිෂ්පාදන මිල දී ගැනීම　　D - නවෝත්පාදන හඳුන්වා දීම

E - මානව විවිධත්වයට ගරු කිරීම　　F - අවදානම් කළමනාකරණය

ඉහත දෑ අතුරෙන් ව්‍යාපාරවල ආර්ථික තිරසර බව තහවුරු කර ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, E　(2) A, B, D, F　(3) B, C, D, E　(4) B, D, E, F　(5) C, D, E, F　(......)

[ දෙවැනි පිටුව බලන්න.

tamilguru.lk

**5.** ශ්‍රී ලංකාවේ බදු වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - සමාගම් බද්ද B - ජාතිය ගොඩගැනීමේ බද්ද
C - එකතු කළ අගය මත බද්ද D - රේගු බද්ද
E - සුරා බද්ද F - ප්‍රාග්ධන ලාභ බද්ද

ඉහත දැ අතුරෙන් සෘජු බදු වර්ග පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, B, C (2) A, B, F (3) B, E, F (4) C, D, E (5) D, E, F (......)

**6.** කිසියම් භාණ්ඩයක කල් ඉකුත්වීමේ දිනය සඳහන් නොකිරීම තුළින් උල්ලංඝනය වන්නේ පාරිභෝගිකයාගේ කුමන අයිතිවාසිකම ද?

(1) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
(2) තෝරාගැනීමට ඇති අයිතිය
(3) තොරතුරු දැනගැනීමට ඇති අයිතිය
(4) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
(5) ආරක්ෂාව සලසාගැනීමට ඇති අයිතිය (......)

More Past Papers at
tamilguru.lk

**7.** පහත වගුවේ සමාගම් වර්ග හා එම සමාගම්වල ලක්ෂණ කිහිපයක් දැක්වේ.

| සමාගම් වර්ග | ලක්ෂණ |
|---|---|
| (i) සීමාසහිත පෞද්ගලික සමාගම් | A - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම |
| (ii) සීමාසහිත පොදු සමාගම් | B - ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර විදේශයන්හි පමණක් ව්‍යාපාර කටයුතු කිරීම |
| (iii) ඇපයෙන් සීමිත සමාගම් | C - කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වීම |
| (iv) සීමාරහිත සමාගම් | D - ලාභ බෙදාහැරීමක් නොකිරීම |
| (v) අක්වෙරළ සමාගම් | E - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම |

ඉහත දී ඇති සමාගම් වර්ග අනුපිළිවෙළ අනුව සමාගම්වල ලක්ෂණ නිවැරදි ව ගළපා ඇති වරණය කුමක් ද?

(1) C, A, D, E, B (2) C, D, A, B, E (3) D, E, B, C, A
(4) E, A, D, C, B (5) E, C, D, A, B (......)

**8.** ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ සමහරක් පහත දැක්වේ.

A - නීතිමය අවශ්‍යතා අවම වීම
B - අඛණ්ඩ පැවැත්ම
C - අසීමිත වගකීම
D - අන්‍යෝන්‍ය ඒකාග්‍රතාවය
E - ව්‍යාපාරය නමින් බදු ගෙවීම

ඉහත දැ අතුරෙන් හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, B, E (2) A, C, D (3) B, C, D (4) B, D, E (5) C, D, E (......)

**9.** පහත වගුවෙහි ව්‍යාපාර ඒකාබද්ධවීමේ උපායමාර්ග සහ අදාළ විස්තර කිහිපයක් දැක්වේ.

| ඒකාබද්ධවීමේ උපායමාර්ග | විස්තරය |
|---|---|
| (i) තිරස් | A - වෙනත් කර්මාන්තයක ආයතන සමග ඒකාබද්ධ වීම |
| (ii) සිරස් පසුපසට | B - එකම කර්මාන්තයේ ආයතන සමග ඒකාබද්ධ වීම |
| (iii) විෂම | C - පූර්වයෙන් බෙදාහරින්නන් ලෙස කටයුතු කළ ආයතන සමග ඒකාබද්ධ වීම |
| (iv) සිරස් ඉදිරිපසට | D - පූර්වයෙන් සැපයුම්කරුවන් ලෙස කටයුතු කළ ආයතන සමග ඒකාබද්ධ වීම |

ඉහත දී ඇති ඒකාබද්ධවීමේ උපායමාර්ග අනුපිළිවෙළ අනුව අදාළ විස්තරය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) B, D, A, C (3) C, A, B, D (4) C, B, A, D (5) D, B, C, A (......)

**10.** පහත දැ අතුරෙන් අභ්‍යන්තර ව්‍යවසායකත්ව ලක්ෂණය කුමක් ද?

(1) සංවිධානවල තනතුරු සඳහා වඩාත් නිර්මාණශීලී පුද්ගලයන් බඳවා ගැනීම
(2) සංවිධානවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් විසින් නිෂ්පාදනයේ නවෝත්පාදන ක්‍රම හඳුන්වාදීම
(3) සංවිධාන විසින් පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා නිෂ්පාදිත සැපයීම
(4) පාරිසරික හා සමාජීය ගැටලු පිළිබඳ සලකා බලමින් පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීම
(5) මානව හිතවාදී ලෝකයක් නිර්මාණය කිරීමට උත්සාහ දැරීම (......)

**11.** පුද්ගලයකු සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ගැටලු නිසා අධෛර්යමත් වීම
B - සාම්ප්‍රදායික ක්‍රම ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්ත
C - අවදානම් භාරගැනීමට ඇති කැමැත්ත
D - වෙනස් නොවන පරිසරයක වැඩ කිරීමට ඇති කැමැත්ත
E - අභියෝග භාරගැනීමට ඇති කැමැත්ත

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයකු සතු ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ E (2) B සහ C (3) C සහ D (4) C සහ E (5) D සහ E (......)

**12.** ඒකක භාරයන්හි ආයෝජනය කිරීම තුළින් ආයෝජකයාට ලැබෙන වාසියක් වනුයේ,

(1) ආයෝජන සඳහා ඉහළ ප්‍රතිලාභයක් හිමි වීම ය.
(2) ඒකක භාරයෙහි කළමනාකාරිත්වයට සම්බන්ධ වීමට හැකි වීම ය.
(3) ප්‍රසාද කොටස් ලබාගැනීමට හිමිකමක් පැවතීම ය.
(4) ඕනෑම අවස්ථාවක දී දඩ මුදල් නොගෙවා ආයෝජනය කළ මුදල ආපසු ගත හැකි වීම ය.
(5) ආයෝජන ප්‍රතිලාභ මත ආදායම් බදු ගෙවිය යුතු නොවීම ය. (......)

**13.** චෙක්පත් රේඛනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) රේඛනය නොකරන ලද චෙක්පතක් ආදායකයා හට රේඛනය කළ හැක
(2) ආදායකයාට තම අත්සන යොදා චෙක්පතෙහි ඇති රේඛනය අවලංගු කළ හැක
(3) රේඛනය කරන ලද සියලු ම චෙක්පත් පිටසන් කර අන් අයකුට පැවරිය හැක
(4) රේඛනය සහිත සෑම චෙක්පතකට ම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත හැක
(5) මුදල් චෙක්පත් රේඛනය කළ නොහැක (......)

**14.** මධුරි A සහ B නමැති රක්ෂණ සමාගම් දෙකෙහි අනුපිළිවෙළින් රු. 300 000 හා රු. 400 000 වශයෙන් රක්ෂණ ඔප්පු දෙකක් ලබා ගෙන නියමිත පරිදි රක්ෂණ වාරික මුදල් ගෙවා ඇත. රක්ෂණ කාලසීමාව තුළ දී මධුරි මියගියහොත් ලබාගත හැකි වන්දි මුදල වන්නේ,

(1) රු. 300 000 කි. (2) රු. 350 000 කි. (3) රු. 400 000 කි.
(4) රු. 700 000 කි. (5) වන්දි ඉල්ලීමට හිමිකමක් නොමැත. (......)

**15.** කළමනාකරුවකු තම වගකීම ලෙස ප්‍රකාශ කරන ලද්දේ "ව්‍යාපාරයට සාධාරණ ඉපැයුමක් ලබා දෙන අතර ම ආයතනය ආසන්නයේ ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ද උසස් කරලීම ය." මෙම ප්‍රකාශය මගින් වඩාත් හොඳින් ගම්‍යවන ආයතනය වගකිව යුතු පාර්ශ්ව වන්නේ,

(1) සමාජය හා ගනුදෙනුකරුවන් ය. (2) අයිතිකරුවන් සහ සේවකයන් ය.
(3) අයිතිකරුවන් සහ සමාජය ය. (4) අයිතිකරුවන් සහ ගනුදෙනුකරුවන් ය.
(5) අයිතිකරුවන් සහ රජය ය. (......)

**16.** ප්‍රවාහනයේ මූලිකාංග නිවැරදිව ඇතුළත් වන වරණය කුමක් ද?

(1) මාධ්‍යය, බලය, මාර්ගය, පර්යන්තය (2) මාධ්‍යය, බලය, පිරිවැය, වේගය
(3) මාධ්‍යය, පර්යන්තය, පිරිවැය, වේගය (4) මාධ්‍යය, බලය, මාර්ගය, වේගය
(5) ධාරිතාව, මාර්ගය, පර්යන්තය, බලය (......)

**17.** 'සුපිරි වෙළෙඳසැල' යන්න වඩාත් නිවැරදිව නිර්වචනය කර ඇති ප්‍රකාශය කුමක් ද?

(1) අත්‍යවශ්‍ය සහ පහසු භාණ්ඩ ස්වයං සේවා පදනම මත සිල්ලර වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි.
(2) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ බෙදාහැරීම සඳහා රට පුරා ශාඛා වෙළෙඳසැල් පවත්වාගන්නා වෙළෙඳසැලකි.
(3) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට එකඟ වී ඇති වෙළෙඳසැලකි.
(4) එක ම ගොඩනැගිල්ලක් තුළ එක් එක් භාණ්ඩ වර්ගය සඳහා වෙන වෙන ම අංශ පවත්වාගෙන යනු ලබන වෙළෙඳසැලකි.
(5) විශාල ප්‍රමාණයෙන් භාණ්ඩ තොග රඳවාගෙන ඒවා තොග වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි. (......)

**18.** ජාත්‍යන්තර වෙළෙඳමේ දී භාවිත කරනු ලබන ලේඛන වර්ග සහ ඒවා සම්බන්ධ විස්තර කිහිපයක් පහත දැක්වේ.

| ලේඛන වර්ගය | විස්තර |
|---|---|
| (i) රේගු සටහන්කරය | A - භාණ්ඩ නැවට භාරගත් බවට පිළිගැනීම |
| (ii) ඉන්වොයිසිය | B - අපනයන භාණ්ඩ නිෂ්පාදනය කළ රටෙහි නම සහතික කිරීම |
| (iii) ප්‍රභවස්ථාන සහතිකය | C - මිල, ප්‍රමාණය, මුළු වටිනාකම හා අපනයනකරුගේ නම යනාදිය පිළිබඳ විස්තරය |
| (iv) නෞභාරපත (B/L) | D - නියෝජිතයකු විසින් ආනයන හෝ අපනයන භාණ්ඩ පිළිබඳව සකසනු ලබන ප්‍රකාශය |

ඉහත දී ඇති ලේඛන වර්ග අනුපිළිවෙළ අනුව අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) B, C, A, D (3) B, D, C, A (4) D, B, C, A (5) D, C, B, A (......)

**19.** කළමනාකරුවකුගේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - සම්බන්ධීකරණය  B - සන්නිවේදනය
C - උපාය මාර්ග සැලසුම් කිරීම  D - මෙහෙයවීම
E - පාලනය  F - ප්‍රතිපත්ති සංවර්ධනය

ඉහත දැ අතුරෙන් ඉහළ කළමනාකරණයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A සහ D (2) B සහ E (3) C සහ F (4) D සහ E (5) E සහ F (......)

**20.** ව්‍යාපාරයක මූල්‍ය සම්පාදන ප්‍රභව කිහිපයක් පහත දැක්වේ.

A - වාණිජ පත්‍රිකා  B - බැංකු ණය
C - ස්ථාවර වත්කම් විකිණීම  D - ණයකර නිකුතුව
E - ක්ෂය සඳහා වෙන් කිරීම්  F - වෙළෙඳ ණය
G - රඳවාගත් ලාභ  H - තොග අලෙවිය

More Past Papers at
tamilguru.lk

ඉහත දැ අතුරෙන් අභ්‍යන්තර සෘජු මූල්‍ය සම්පාදන ප්‍රභවයන් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, C, D, G (2) A, C, E, G (3) B, D, F, H (4) C, F, G, H (5) C, E, G, H (......)

**21.** XYZ සමාගමේ ස්ථාවර පිරිවැය රු. 60 000කි. A නමැති භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන විචල්‍ය පිරිවැය රුපියල් 1.00 කි. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රුපියල් 3.00 ක් නම් රුපියල් 50 000 ක ලාභයක් ලබාගැනීම සඳහා නිපදවිය යුතු මුළු නිෂ්පාදන ඒකක ප්‍රමාණය කොපමණ ද?

(1) 20 000 (2) 30 000 (3) 40 000 (4) 50 000 (5) 55 000 (......)

**22.** පහත වගුව මගින් දැක්වෙන්නේ සීතා විසින් යෝගට් නිෂ්පාදනයේ ගුණත්වය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කරන ලද තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම හා ක්‍රියාමාර්ග කිහිපයකි.

| තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම | ක්‍රියාමාර්ග |
|---|---|
| (i) තත්ත්ව ආරක්ෂණය | A - නිරතුරුව ම නිෂ්පාදනය පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සේවක කණ්ඩායම් පිහිටුවීම |
| (ii) තත්ත්ව කව | B - නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක ම ගුණාත්මකභාවය නිරන්තරව අධීක්ෂණයට ලක් කිරීම |
| (iii) ශුන්‍ය දෝෂ | C - නිෂ්පාදනය සඳහා සැමවිට ම නිවැරදි අමුද්‍රව්‍ය භාවිත කිරීම |
| (iv) ගුණත්ව ප්‍රමිත | D - සංවිධානයේ සියලු ම ක්‍රියාවලින්හි ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කිරීම |
| (v) සමස්ත ගුණත්ව කළමනාකරණය | E - සැමවිට ම නිෂ්පාදන 100%ක ගුණත්වයෙන් පවත්වා ගැනීමට අඛණ්ඩව උත්සාහ දැරීම |

ඉහත දී ඇති තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම අනුපිළිවෙළ අනුව අදාළ ක්‍රියාමාර්ග නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, B, E, D, C (2) A, C, B, D, E (3) B, A, E, C, D
(4) B, C, D, E, A (5) E, B, C, D, A (......)

**23.** හැකිතාක් අවම පිරිවැයකින් භාණ්ඩ නිෂ්පාදනය කර වෙළෙඳපොළ තුළ එම භාණ්ඩ සුලභ කිරීමට ව්‍යාපාරිකයකු දරන උත්සාහය වඩාත් හොඳින් නිරූපණය වන්නේ කුමන සංකල්පය මගින් ද?

(1) අලෙවිකරණ සංකල්පය (2) සමාජීය අලෙවිකරණ සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) නිෂ්පාදිත සංකල්පය (5) නිෂ්පාදන සංකල්පය (......)

**24.** නිෂ්පාදිතයක් සම්බන්ධ පාරිභෝගික වටිනාකම් ධූරාවලියේ අංග පහත දැක්වේ.

A - හර ප්‍රතිලාභ
B - වැඩි දියුණු කළ නිෂ්පාදිත
C - මූලික නිෂ්පාදිත
D - අපේක්ෂිත නිෂ්පාදිත
E - විභව නිෂ්පාදිත

ඉහත සඳහන් පාරිභෝගික වටිනාකම් ධූරාවලිය නිවැරදිව අනුපිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A, B, D, C, E (2) A, C, D, B, E (3) B, A, E, C, D
(4) B, E, A, C, D (5) C, A, B, D, E (......)

**25.** ව්‍යාපාර ආයතනයක් විසින් ඉටු කරන ලද ප්‍රවර්ධන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදිත පිළිබඳ විස්තර සැපයීම
B - ලොතරැයි ක්‍රම හඳුන්වා දීම
C - මිල අඩු කිරීම
D - ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය ලබා දීම
E - නිෂ්පාදන සාම්පල් ලබා දීම
F - වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම
G - මිල වට්ටම් හඳුන්වා දීම

ඉහත දැ අතුරෙන් විකුණුම් ප්‍රවර්ධනය සඳහා පමණක් අදාළ කාර්යයන් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, D, E, F (2) B, D, E. F (3) B, C, E, G (4) C, D, F, G (5) C, E, F, G (……)

**26.** සේවක ප්‍රවාසිතාවය යනුවෙන් අදහස් කරනුයේ සේවකයින්,
(1) රාජකාරි සඳහා වාර්තා නොකිරීමයි.
(2) සංවිධානය හැරයාමයි.
(3) රාජකාරි නිවාඩු ලබා ගැනීමයි.
(4) හිමිකම් ඇති නිවාඩු ලබා ගැනීමයි.
(5) උපදෙස් පිළිනොගැනීමයි. (……)

**27.** 'රැකියාස්ථ පුහුණුව' යන්නට අයත් **නොවන්නේ** කුමක් ද?
(1) ආධුනිකත්ව පුහුණුව
(2) රැකියා භ්‍රමණය
(3) සීමාවාසික පුහුණුව (Internship)
(4) සමාකරණය
(5) භූමිකා රංගනය (……)

**28.** විනය කළමනාකරණයේ වැදගත්කම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය තෝරන්න.
(1) සේවකයින් අතර මතභේද අවම කිරීම
(2) සේවකයින්ගේ ස්වයං විශ්වාසය වර්ධනය කිරීම
(3) සේවකයින් වෙත තීරණ දැන්වීම
(4) වෛද්‍ය රක්ෂණ වියදම් අඩුකර ගැනීම
(5) සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීම (……)

**29.** පහත වගුවේ තොරතුරු පද්ධති වර්ග හා ඒවාට අදාළ උදාහරණ දක්වා ඇත.

| තොරතුරු පද්ධති වර්ග | උදාහරණ |
|---|---|
| (i) ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) | A - පුරෝකථන වාර්තා ලබා දීම |
| (ii) කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS) | B - දෛනික තොග වාර්තා ලබා දීම |
| (iii) කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) | C - විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දීම |
| (iv) තීරණ උපකාරක පද්ධති (DSS) | D - වැටුප් වාර්තා සැකසීම |
| (v) විධායක උපකාරක පද්ධති (ESS) | E - ආයෝජන ඇගයීම් වාර්තා ලබා දීම |

ඉහත දී ඇති තොරතුරු පද්ධති වර්ග අනුපිළිවෙළ අනුව උදාහරණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, E, D, A (2) C, D, E, A, B (3) D, C, B, E, A
(4) D, E, A, B, C (5) E, A, B, C D (……)

**30.** ව්‍යාපාර සැලැස්ම පිළිබඳ මගපෙන්වීමක් ලබාදීම සඳහා පිළියෙල කරනු ලබන්නේ,
(1) විධායක සාරාංශයයි.
(2) පිරිවැය සාරාංශයයි.
(3) මුදල් ප්‍රවාහ සාරාංශයයි.
(4) ආදායම් සාරාංශයයි.
(5) ණය පිළිබඳ සාරාංශයයි. (……)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ලාභය අරමුණු කරගත් නමුත් ලියාපදිංචිය **අනිවාර්ය නොවන** ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් වන්නේ ........................ සහ ........................ ව්‍යාපාරයන් ය.

(ආ) අභ්‍යන්තර මිල ස්ථායිතාව මගින් රජයට........................ සහ ........................ අනුපාතය පාලනය කළ හැක.

**32.** (අ) වරලත්ලාභියා විසින් දළ.......................................... වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස වරලත් හිමියා වෙත ගෙවිය යුතු වන්නේ ......................................... වේ.

(ආ) ව්‍යවසායකයකු සාමාන්‍යයෙන් ................................. අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරන අතර, සමාජීය ව්‍යවසායකයකු .................................. අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරයි.

**33.** (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ...................................... සූක්ෂම වන හෙයින් පුද්ගලයන් සඳහා වඩාත් ................................................ සැපයීමට හැකි වේ.

(ආ) පිටතට නැඹුරු වූ ප්‍රවාහන හා සැපයුම් සේවා (outbound logistics) ........................... ආරම්භ වී .............................. අවසන් වේ.

**34.** (අ) රේගු බන්දිත ගුදම් තුළ දී ආනයනය කළ භාණ්ඩ සඳහා වටිනාකමක් එකතු කිරීමෙන් පසුව අපනයනය කිරීම ............................................... වෙළෙඳාම වන අතර ආනයනය කරන උපකරණ භාවිතයෙන් පසුව නැවත එම රට වෙත යැවීම ................................................ අපනයනය වේ.

(ආ) විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා බැංකු ............................ හා ................................ ලිපිය යොදා ගත හැකි වේ.

**35.** (අ) කළමනාකරණයේ දී නිවැරදි දේ සිදු කිරීම .............................. වන අතර කළ යුතු දේ නිවැරදිව කිරීම ................................ වේ.

(ආ) මින්ස්බර්ග්ගේ භූමිකා වර්ගීකරණය අනුව කළමනාකරුවකු විසින් නව ව්‍යාපෘති හඳුන්වා දීම ................................ භූමිකාවෙහි ................................ උපභූමිකාවට අයත් වේ.

**36.** (අ) තාක්ෂණික කුසලතා ඉතා වැදගත් වනුයේ ............................. කළමනාකරුවන් හට වන අතර ................................ කුසලතා සියලු ම මට්ටමේ කළමනාකරුවන් හට එක සමානව වැදගත් වේ.

(ආ) සේවකයින් වෙත ............................ සහ ................................ විධිමත්ව පවරාදීමේ ක්‍රියාවලිය බලතල පැවරීම ලෙස හැඳින්වේ.

**37.** (අ) කාර්ය අභිමුඛ නායකයන් වඩාත් තම අවධානය යොමු කරනුයේ ...................................... වන අතර ........................................ නැඹුරු නායකයන් වඩාත් තම අවධානය යොමු කරනුයේ සේවකයින් වෙත ය.

(ආ) සේවක යෙදවුම් හා ................................ අතර සම්බන්ධතාව ................................ ඵලදායීතාව ලෙස හඳුන්වනු ලැබේ.

**38.** (අ) නිෂ්පාදකයකු විසින් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම .......................... සන්නම ලෙස හඳුන්වන අතර නියමිත වෙළෙන්දෙකු වෙනුවෙන් සන්නමක් නිර්මාණය කිරීම......................... සන්නම ලෙස හැඳින්වේ.

(ආ) ඉලක්ක ඉපයීම මත මිල කිරීමේ දී ...................................... පදනම් වන අතර පවත්නා මිල මත මිල කිරීමේ දී ........................ පදනම් වේ.

**39.** (අ) දිගුකාලීන මූල්‍ය තීරණ ...................................... ව්‍යුහය හා ................................ පිළිබඳ තීරණ ලෙස වර්ග කළ හැක.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් ක්‍රියාකාරකම් මූලිකව ........................................ හා ............................................. වශයෙන් වර්ග කළ හැක.

**40.** (අ) අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම දෙකක් ලෙස ........................ හඳුන්වාදීම සහ ........................ සැලැස්ම භාවිත කළ හැක.

(ආ) නවක සේවකයින් සමාජගත කිරීමේ ක්‍රියාවලිය ................................ වන අතර ඔවුන්ගේ සේවාව ස්ථිර කිරීම දක්වා කාලපරිච්ඡේදය ........................ කාලය වේ.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** වෙළෙඳ ක්‍රියාකාරකම් සඳහා අතරමැදියන් භාවිත කිරීමේ වාසි සහ අවාසි **දෙක** බැගින් දක්වන්න.

| වාසි | අවාසි |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |

**42.** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අරමුණු **හතරක්** සඳහන් කරන්න.

1. ....................
2. ....................
3. ....................
4. ....................

**43.** ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** ලියන්න.

1. ....................
2. ....................
3. ....................
4. ....................

**44.** ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා නිදසුන් **හතරක්** ලියන්න.

1. .................... 2. ....................

3. .................... 4. ....................

**45.** අපද්‍රව්‍ය කළමනාකරණයේ 4 R අංග **හතර** නම් කරන්න.

1. .................... 2. ....................

3. .................... 4. ....................

**46.** විමධ්‍යගත කිරීම මගින් සංවිධානයකට ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න.

1. ....................
2. ....................
3. ....................
4. ....................

**47.** තොග පාලනය හා සම්බන්ධ පහත සමීකරණයහි අඩංගු අක්ෂර මගින් අදහස් කරන්නේ කුමක් ද?

$$EOQ = \sqrt{\frac{2cd}{h}}$$

1. $EOQ$ : ....................
2. $c$ : ....................
3. $d$ : ....................
4. $h$ : ....................

**48.** නව සේවකයකු තෝරාගැනීමේ දී සංවිධානයකට භාවිත කළ හැකි පසුබිම් පරීක්ෂණ වර්ග **හතරක්** සඳහන් කරන්න.


1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

**49.** දත්ත සැලසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් **හතරක්** දක්වන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

**50.** පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

More Past Papers at
tamilguru.lk

1.  ..............................................................................

2. ..............................................................................

3.  ..............................................................................

4.  ..............................................................................

* * *

42883

AL/2019/32/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

2019.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** අනුෂා ජංගම දුරකථන සිල්ලරව අලෙවි කරන අතරම නව මාදිලියේ දුරකථන කවර (phone cover) නිර්මාණ කරන්නියක් ද වේ. නිර්මාණකරණය පිළිබඳව ඇය සතුව මනා දැනුමක් හා පලපුරුද්දක් වේ. ඇය තම අලෙවිය සහ ලාභය වර්ධනය කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් එම දුරකථන කවර සඳහා පහළ මිලක් නියම කරනු ලබයි. 2019 වර්ෂයේ මැද භාගය තුළ ඇගේ කවර විකුණුම් ප්‍රමාණය ඒකක 50 000 කට ළඟා වූ අතර ඒකක 20 000 විකුණා ඇත්තේ මංගත (online) ක්‍රමය තුළිනි. අනුෂා තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා SWOT (ශ.දු.අ.ත) විශ්ලේෂණයෙහි යෙදෙමින් සිටියි.

(i) (අ) ඉහත සිද්ධි අධ්‍යයනයෙහි ඇතුළත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් **දෙක** විස්තර කරන්න.
(ආ) ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු **දෙක** මොනවා ද? (ලකුණු 04 යි)

(ii) දුරකථන කවර සඳහා ඉහළ පිරිවැටුමක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මංගත වෙළෙඳාම තුළින් අනුෂාට ලබා ගත හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර සඳහා SWOT විශ්ලේෂණය නිසා ඇති වන වාසි **හතරක්** දක්වන්න.
(ආ) දුරකථන කවර කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා **දෙකක්** හා තර්ජන **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) අනුෂා සතුව ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදාගත හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** (i) කළමනාකරුවකු විසින් ප්‍රකාශ කරන ලද්දේ සමාගමේ අරමුණු හා සමාගම කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන්ගේ අරමුණු අතර ගැටුම්කාරී බව කළමනාකරුවන් හට අභියෝගයක් බවයි. සමාගමක අරමුණු සහ කොටස්කරුවන්ගේ අරමුණු උදාහරණ ලෙස ගනිමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'තිරසර සංවර්ධනය' යන්න පැහැදිලි කරන්න.
(ආ) ව්‍යාපාරික සංවිධානයකට තම පාරිභෝගිකයින් කෙරෙහි ඇති සමාජ වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාර සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

[ දෙවැනි පිටුව බලන්න.

(iv) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබා දෙන සේවා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**3.** (i) බේකරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් මිල ඉහළ යාම නිසා බේකරි හිමියකු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණයෙහි ඇති වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයෙන් බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදී. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදී. එසේ ම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(iii) විශාල ආයතනයක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ නොසලකා හරිමින් ඇතැම් ආයතන කුඩා ව්‍යාපාර ලෙසටම පවත්වා ගැනීමට අදහස් කරන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මගින් ව්‍යාපාරිකයකුට ලබා ගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින් වෙන් කර හඳුනා ගත හැකි ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) විධිමත් හා අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලින් මුදල් ලබාගෙන තම ප්‍රදේශයේ කිරි නිෂ්පාදන මිලට ගෙන විකිණීමේ ආයතනයක් ආරම්භ කිරීමට ලක්ෂ්මී අදහස් කර සිටියි. අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලට වඩා විධිමත් මූල්‍ය සම්පාදන මාර්ග තුළින් ලක්ෂ්මීට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'ධාරක චෙක්පත්', 'විධාන චෙක්පත්' හා සසඳන්න.

(ආ) 'සේව්‍ය වගකීම් රක්ෂණය' යන්න විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** සඳහන් කර, එම දුර්වලතා මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **හතරක්** සඳහන් කරන්න.

(ආ) වාචිකව පණිවුඩයක් සන්නිවේදනය කිරීමේ දී එම පණිවුඩය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'සාපේක්ෂ පිරිවැය වාසිය' යන්න විස්තර කරන්න.


(ආ) 'විද්‍යුත් ගෙවීම් ක්‍රම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

More Past Papers at
tamilguru.lk

## II කොටස

**5.** (i) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.




(අ) 'සංවිධාන ව්‍යුහය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කරමින් ඉහත දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන්නේ X Y සමාගමේ තොරතුරු කිහිපයකි.

| | අයවැයගත (රු.) | සත්‍ය (රු.) |
|---|---|---|
| විකුණුම් ආදායම | 3 000 | 2 750 |
| විකුණුම් පිරිවැය | 2 100 | 12 700 |

(අ) විකුණුම් ආදායම් විචලනය හා විකුණුම් පිරිවැය විචලනය ගණනය කරන්න.


(ආ) විකුණුම් ආදායම් විචලනය විය හැකි හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) 'ක්‍රියාවලි පිරියත', 'නිෂ්පාදන පිරියත' හා සසඳන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) XYZ සමාගමේ රූපවාහිනී යන්ත්‍රවල තොග මට්ටම් පිළිබඳව ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ.




පහත දෑ ගණනය කරන්න.

(අ) චක්‍රීය කාලය

(ආ) යළි ඇණවුම් ප්‍රමාණය

(ඉ) ආරක්ෂිත තොගය

(ඊ) පොරොත්තු කාලය (ලකුණු 04 යි)

(ii) ද්‍රව්‍ය ඵලදායීතාවය වර්ධනය කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'වෙළෙඳපොළ ඛණ්ඩනය' යනු කුමක් ද?

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය විකුණුම් වර්ධනයට උදව් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) 'පාරිභෝගික වටිනාකම' හා 'පාරිභෝගික තෘප්තිය' අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'භාණ්ඩයක ජීවන චක්‍රය' (PLC) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) නිෂ්පාදකයකුට භාණ්ඩයක ජීවන චක්‍රය අවබෝධ කර ගැනීම තුළින් ලැබිය හැකි වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** (i) ව්‍යාපාර සංවිධානයක බාහිර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා ඒවායේ සීමා **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරික තීරණ කෙරෙහි ද්‍රවශීලතා අනුපාතවල වැදගත්කම විස්තර කරන්න.

(ආ) සමාගමක කොටස් මිල වැඩි වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'රැකියා විස්තරය' හා 'රැකියා පිරිවිතරය' අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න.

(ආ) සේවකයින් වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා ගැනීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි." මෙම ක්‍රමයේ ඇති සීමා **දෙකක්** විස්තර කරන්න.

(ආ) පරිවාස කාලය තුළ තමන් වෙත පවරන ලද රාජකාරී හා වගකීම් ඉටු කිරීමට අපොහොසත් සේවකයකුට විරුද්ධව කළමනාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) සංවිධානයක මුදල් ගලා යාම් පාලනය කළ හැකි ආකාර **හතරක්** යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග පැහැදිලි කරන්න.

(ආ) තරගකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

More Past Papers at
tamilguru.lk

42933

AL/2019/32/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.08 / 0830 - 1030

| | |
|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය | I |
| வணிகக் கல்வி | I |
| Business Studies | I |

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- * **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- * **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
- * ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- * ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- * සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| 01 - 30 | |
| 31 - 50 | |
| **එකතුව** | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** ව්‍යාපාර විකාශනයේ අවධි හතර පහත දැක්වේ.

A - කාර්මික විප්ලවය B - මුදල් භාවිතය
C - භාණ්ඩ හුවමාරුව D - තොරතුරු ආර්ථිකය

ඉහත සඳහන් ව්‍යාපාර විකාශනයේ අවධි නිවැරදිව අනුපිළිවෙළට දක්වා ඇති වරණය තෝරන්න.

(1) A, C, D, B (2) B, A, C, D (3) B, D, A, C (4) C, A, B, D (5) C, B, A, D (......)

**2.** සමාජීය හා සංස්කෘතික පරිසරයට අයත් මූලිකාංග නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) විශ්වාස, අගනාකම්, තාක්ෂණය හා සම්මත
(2) අගනාකම්, ආයතන, වයස් ව්‍යුහ හා සම්ප්‍රදායන්
(3) සිරිත් විරිත්, අගනාකම්, සංවිධාන ව්‍යුහ හා සම්ප්‍රදායන්
(4) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා රෙගුලාසි
(5) විශ්වාස, අගනාකම්, සිරිත් විරිත් හා සම්ප්‍රදායන් (......)

**3.** පහත වගුවේ සාර්ව පරිසර මූලිකාංග සහ ඊට අදාළ සිද්ධීන් කිහිපයක් දක්වා ඇත.

| මූලිකාංග | සිද්ධීන් |
|---|---|
| (i) ආර්ථික | A - දේශගුණික තත්ත්වයන් වෙනස්වීම |
| (ii) ස්වාභාවික | B - නව කම්කරු නීතිරීති බලගැන්වීම |
| (iii) තාක්ෂණික | C - නව නිෂ්පාදන ක්‍රමයක් සොයා ගැනීම |
| (iv) නෛතික | D - විදේශ විනිමය අනුපාතය වෙනස් වීම |

ඉහත දී ඇති මූලිකාංග අනුපිළිවෙළ අනුව සිද්ධීන් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) B, D, C, A (3) C, A, B, D (4) C, D, B, A (5) D, A, C, B (......)

**4.** තිරසර සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A - තාක්ෂණික සංවර්ධනය B - සේවක සුභසාධනය
C - පරිසර හිතකාමී නිෂ්පාදන මිල දී ගැනීම D - නවෝත්පාදන හඳුන්වා දීම
E - මානව විවිධත්වයට ගරු කිරීම F - අවදානම් කළමනාකරණය

ඉහත ද ඇතුරෙන් ව්‍යාපාරවල ආර්ථික තිරසර බව තහවුරු කර ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, C, E (2) A, B, D, F (3) B, C, D, E (4) B, D, E, F (5) C, D, E, F (......)

[ දෙවැනි පිටුව බලන්න.

**5.** ශ්‍රී ලංකාවේ බදු වර්ග කිහිපයක් පහත දැක්වේ.

A - සමාගම් බද්ද
B - ජාතිය ගොඩගැනීමේ බද්ද
C - එකතු කළ අගය මත බද්ද
D - රේගු බද්ද
E - සුරා බද්ද
F - ප්‍රාග්ධන ලාභ බද්ද

ඉහත දැ අතුරෙන් සෘජු බදු වර්ග පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, B, C (2) A, B, F (3) B, E, F (4) C, D, E (5) D, E, F (……)

**6.** කිසියම් භාණ්ඩයක කල් ඉකුත්වීමේ දිනය සඳහන් නොකිරීම තුළින් උල්ලංඝනය වන්නේ පාරිභෝගිකයාගේ කුමන අයිතිවාසිකම ද?

(1) මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය
(2) තෝරාගැනීමට ඇති අයිතිය
(3) තොරතුරු දැනගැනීමට ඇති අයිතිය
(4) පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
(5) ආරක්ෂාව සලසාගැනීමට ඇති අයිතිය (……)

**7.** පහත වගුවේ සමාගම් වර්ග හා එම සමාගම්වල ලක්ෂණ කිහිපයක් දැක්වේ.

| සමාගම් වර්ග | ලක්ෂණ |
|---|---|
| (i) සීමාසහිත පෞද්ගලික සමාගම් | A - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම |
| (ii) සීමාසහිත පොදු සමාගම් | B - ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කර විදේශයන්හි පමණක් ව්‍යාපාර කටයුතු කිරීම |
| (iii) ඇපයෙන් සීමිත සමාගම් | C - කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වීම |
| (iv) සීමාරහිත සමාගම් | D - ලාභ බෙදාහැරීමක් නොකිරීම |
| (v) අක්වෙරළ සමාගම් | E - කොටස් හා ණයකර ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම |

ඉහත දී ඇති සමාගම් වර්ග අනුපිළිවෙළ අනුව සමාගම්වල ලක්ෂණ නිවැරදි ව ගළපා ඇති වරණය කුමක් ද?

(1) C, A, D, E, B (2) C, D, A, B, E (3) D, E, B, C, A
(4) E, A, D, C, B (5) E, C, D, A, B (……)

**8.** ව්‍යාපාරවලට අදාළ ලක්ෂණ සමහරක් පහත දැක්වේ.

A - නීතිමය අවශ්‍යතා අවම වීම
B - අඛණ්ඩ පැවැත්ම
C - අසීමිත වගකීම
D - අන්‍යෝන්‍ය ඒකඟතාවය
E - ව්‍යාපාරය නමින් බදු ගෙවීම

ඉහත දැ අතුරෙන් හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, B, E (2) A, C, D (3) B, C, D (4) B, D, E (5) C, D, E (……)

**9.** පහත වගුවෙහි ව්‍යාපාර ඒකාබද්ධවීමේ උපායමාර්ග සහ අදාළ විස්තර කිහිපයක් දැක්වේ.

| ඒකාබද්ධවීමේ උපායමාර්ග | විස්තරය |
|---|---|
| (i) තිරස් | A - වෙනත් කර්මාන්තයක ආයතන සමග ඒකාබද්ධ වීම |
| (ii) සිරස් පසුපසට | B - එකම කර්මාන්තයේ ආයතන සමග ඒකාබද්ධ වීම |
| (iii) විෂම | C - පූර්වයෙන් බෙදාහරින්නන් ලෙස කටයුතු කළ ආයතන සමග ඒකාබද්ධ වීම |
| (iv) සිරස් ඉදිරිපසට | D - පූර්වයෙන් සැපයුම්කරුවන් ලෙස කටයුතු කළ ආයතන සමග ඒකාබද්ධ වීම |

ඉහත දී ඇති ඒකාබද්ධවීමේ උපායමාර්ග අනුපිළිවෙළ අනුව අදාළ විස්තරය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) B, D, A, C (3) C, A, B, D (4) C, B, A, D (5) D, B, C, A (……)

**10.** පහත දැ අතුරෙන් අභ්‍යන්තර ව්‍යවසායකත්ව ලක්ෂණය කුමක් ද?

(1) සංවිධානවල තනතුරු සඳහා වඩාත් නිර්මාණශීලී පුද්ගලයන් බඳවා ගැනීම
(2) සංවිධානවල කටයුතු කරන නිර්මාණශීලී පුද්ගලයන් විසින් නිෂ්පාදනයේ නවෝත්පාදන ක්‍රම හඳුන්වාදීම
(3) සංවිධාන විසින් පුද්ගල අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා නිෂ්පාදිත සැපයීම
(4) පාරිසරික හා සමාජීය ගැටලු පිළිබඳ සලකා බලමින් පරිසරයට ධනාත්මක බලපෑම් ඇති කිරීම
(5) මානව හිතවාදී ලෝකයක් නිර්මාණය කිරීමට උත්සාහ දැරීම (……)

**11.** පුද්ගලයකු සතු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A - ගැටලු නිසා අධෛර්යමත් වීම
B - සාම්ප්‍රදායික ක්‍රම ක්‍රියාත්මක කිරීමට ඇති කැමැත්ත
C - අවදානම් භාරගැනීමට ඇති කැමැත්ත
D - වෙනස් නොවන පරිසරයක වැඩ කිරීමට ඇති කැමැත්ත
E - අභියෝග භාරගැනීමට ඇති කැමැත්ත

ඉහත දැ අතුරෙන් ව්‍යවසායකයකු සතු ලක්ෂණ පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ E (2) B සහ C (3) C සහ D (4) C සහ E (5) D සහ E (……)

**12.** ඒකක භාරයන්හි ආයෝජනය කිරීම තුළින් ආයෝජකයාට ලැබෙන වාසියක් වනුයේ,

(1) ආයෝජන සඳහා ඉහළ ප්‍රතිලාභයක් හිමි වීම ය.
(2) ඒකක භාරයෙහි කළමනාකාරිත්වයට සම්බන්ධ වීමට හැකි වීම ය.
(3) ප්‍රසාද කොටස් ලබාගැනීමට හිමිකමක් පැවතීම ය.
(4) ඕනෑම අවස්ථාවක දී දඩ මුදල් නොගෙවා ආයෝජනය කළ මුදල ආපසු ගත හැකි වීම ය.
(5) ආයෝජන ප්‍රතිලාභ මත ආදායම් බදු ගෙවිය යුතු නොවීම ය. (……)

**13.** චෙක්පත් රේඛනය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) රේඛනය නොකරන ලද චෙක්පතක් ආදායකයා හට රේඛනය කළ හැක
(2) ආදායකයාට තම අත්සන යොදා චෙක්පතෙහි ඇති රේඛනය අවලංගු කළ හැක
(3) රේඛනය කරන ලද සියලු ම චෙක්පත් පිටසන් කර අන් අයකුට පැවරිය හැක
(4) රේඛනය සහිත සෑම චෙක්පතකට ම බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත හැක
(5) මුදල් චෙක්පත් රේඛනය කළ නොහැක (……)

**14.** මධුරි A සහ B නමැති රක්ෂණ සමාගම් දෙකෙහි අනුපිළිවෙළින් රු. 300 000 හා රු. 400 000 වශයෙන් රක්ෂණ ඔප්පු දෙකක් ලබා ගෙන නියමිත පරිදි රක්ෂණ වාරික මුදල් ගෙවා ඇත. රක්ෂණ කාලසීමාව තුළ දී මධුරි මියගියහොත් ලබාගත හැකි වන්දි මුදල වන්නේ,

(1) රු. 300 000 කි. (2) රු. 350 000 කි. (3) රු. 400 000 කි.
(4) රු. 700 000 කි. (5) වන්දි ඉල්ලීමට හිමිකමක් නොමැත. (……)

**15.** කළමනාකරුවකු තම වගකීම ලෙස ප්‍රකාශ කරන ලද්දේ "ව්‍යාපාරයට සාධාරණ ඉපැයුමක් ලබා දෙන අතර ම ආයතනය ආසන්නයේ ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය ද උසස් කරලීම ය." මෙම ප්‍රකාශය මගින් වඩාත් හොඳින් ගම්‍යවන ආයතනය වගකිව යුතු පාර්ශ්ව වන්නේ,

(1) සමාජය හා ගනුදෙනුකරුවන් ය. (2) අයිතිකරුවන් සහ සේවකයන් ය.
(3) අයිතිකරුවන් සහ සමාජය ය. (4) අයිතිකරුවන් සහ ගනුදෙනුකරුවන් ය.
(5) අයිතිකරුවන් සහ රජය ය. (……)

**16.** ප්‍රවාහනයේ මූලිකාංග නිවැරදිව ඇතුළත් වන වරණය කුමක් ද?

(1) මාධ්‍යය, බලය, මාර්ගය, පර්යන්තය (2) මාධ්‍යය, බලය, පිරිවැය, වේගය
(3) මාධ්‍යය, පර්යන්තය, පිරිවැය, වේගය (4) මාධ්‍යය, බලය, මාර්ගය, වේගය
(5) ධාරිතාව, මාර්ගය, පර්යන්තය, බලය (……)

**17.** 'සුපිරි වෙළෙඳසැල' යන්න වඩාත් නිවැරදිව නිර්වචනය කර ඇති ප්‍රකාශය කුමක් ද?

(1) අත්‍යවශ්‍ය සහ පහසු භාණ්ඩ ස්වයං සේවා පදනම මත සිල්ලර වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි.
(2) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ බෙදාහැරීම සඳහා රට පුරා ශාඛා වෙළෙඳසැල් පවත්වාගන්නා වෙළෙඳසැලකි.
(3) එක් නිෂ්පාදකයෙකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට එකඟ වී ඇති වෙළෙඳසැලකි.
(4) එක ම ගොඩනැගිල්ලක් තුළ එක් එක් භාණ්ඩ වර්ගය සඳහා වෙන වෙන ම අංශ පවත්වාගෙන යනු ලබන වෙළෙඳසැලකි.
(5) විශාල ප්‍රමාණයෙන් භාණ්ඩ තොග රඳවාගෙන ඒවා තොග වශයෙන් අලෙවි කරන වෙළෙඳසැලකි. (……)

**18.** ජාත්‍යන්තර වෙළෙඳමේ දී භාවිත කරනු ලබන ලේඛන වර්ග සහ ඒවා සම්බන්ධ විස්තර කිහිපයක් පහත දැක්වේ.

| ලේඛන වර්ගය | විස්තර |
|---|---|
| (i) රේගු සටහන්කරය | A - භාණ්ඩ නැවට භාරගත් බවට පිළිගැනීම |
| (ii) ඉන්වොයිසිය | B - අපනයන භාණ්ඩ නිෂ්පාදනය කළ රටෙහි නම සහතික කිරීම |
| (iii) ප්‍රභවස්ථාන සහතිකය | C - මිල, ප්‍රමාණය, මුළු වටිනාකම හා අපනයනකරුගේ නම යනාදිය පිළිබඳ විස්තරය |
| (iv) නෞභාරපත (B/L) | D - නියෝජිතයකු විසින් ආනයන හෝ අපනයන භාණ්ඩ පිළිබඳව සකසනු ලබන ප්‍රකාශය |

ඉහත දී ඇති ලේඛන වර්ග අනුපිළිවෙළ අනුව අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) B, C, A, D (3) B, D, C, A (4) D, B, C, A (5) D, C, B, A (……)

**19.** කළමනාකරුවකුගේ කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - සම්බන්ධීකරණය B - සන්නිවේදනය
C - උපාය මාර්ග සැලසුම් කිරීම D - මෙහෙයවීම
E - පාලනය F - ප්‍රතිපත්ති සංවර්ධනය

ඉහත දැ අතුරෙන් ඉහළ කළමනාකරණයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A සහ D (2) B සහ E (3) C සහ F (4) D සහ E (5) E සහ F (……)

**20.** ව්‍යාපාරයක මූල්‍ය සම්පාදන ප්‍රභව කිහිපයක් පහත දැක්වේ.

A - වාණිජ පත්‍රිකා B - බැංකු ණය
C - ස්ථාවර වත්කම් විකිණීම D - ණයකර නිකුතුව
E - ක්ෂය සඳහා වෙන් කිරීම් F - වෙළෙඳ ණය
G - රඳවාගත් ලාභ H - තොග අලෙවිය

ඉහත දැ අතුරෙන් අභ්‍යන්තර සෘජු මූල්‍ය සම්පාදන ප්‍රභවයන් පමණක් අඩංගු වරණය කුමක් ද?

(1) A, C, D, G (2) A, C, E, G (3) B, D, F, H (4) C, F, G, H (5) C, E, G, H (……)

**21.** XYZ සමාගමේ ස්ථාවර පිරිවැය රු. 60 000කි. A නමැති භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා දරනු ලබන විචල්‍ය පිරිවැය රුපියල් 1.00 කි. මෙම භාණ්ඩයේ ඒකකයක විකුණුම් මිල රුපියල් 3.00 ක් නම් රුපියල් 50 000 ක ලාභයක් ලබාගැනීම සඳහා නිපදවිය යුතු මුළු නිෂ්පාදන ඒකක ප්‍රමාණය කොපමණ ද?

(1) 20 000 (2) 30 000 (3) 40 000 (4) 50 000 (5) 55 000 (……)

**22.** පහත වගුව මගින් දැක්වෙන්නේ සීතා විසින් යෝගට් නිෂ්පාදනයේ ගුණත්වය පවත්වාගෙන යාම සඳහා අනුගමනය කරන ලද තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම හා ක්‍රියාමාර්ග කිහිපයකි.

| තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම | ක්‍රියාමාර්ග |
|---|---|
| (i) තත්ත්ව ආරක්ෂණය | A - නිරතුරුව ම නිෂ්පාදනය පිළිබඳ ගැටළු සාකච්ඡා කිරීම සඳහා සේවක කණ්ඩායම් පිහිටුවීම |
| (ii) තත්ත්ව කව | B - නිෂ්පාදන ක්‍රියාවලියේ සෑම අදියරක ම ගුණාත්මකභාවය නිරන්තරව අධීක්ෂණයට ලක් කිරීම |
| (iii) ශූන්‍ය දෝෂ | C - නිෂ්පාදනය සඳහා සැමවිට ම නිවැරදි අමුද්‍රව්‍ය භාවිත කිරීම |
| (iv) ගුණත්ව ප්‍රමිත | D - සංවිධානයේ සියලු ම ක්‍රියාවලින්හි ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කිරීම |
| (v) සමස්ත ගුණත්ව කළමනාකරණය | E - සැමවිට ම නිෂ්පාදන 100%ක ගුණත්වයෙන් පවත්වා ගැනීමට අඛණ්ඩව උත්සාහ දැරීම |

ඉහත දී ඇති තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම අනුපිළිවෙළ අනුව අදාළ ක්‍රියාමාර්ග නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, B, E, D, C (2) A, C, B, D, E (3) B, A, E, C, D
(4) B, C, D, E, A (5) E, B, C, D, A (……)

**23.** හැකිතාක් අවම පිරිවැයකින් භාණ්ඩ නිෂ්පාදනය කර වෙළෙඳපොළ තුළ එම භාණ්ඩ සුලභ කිරීමට ව්‍යාපාරිකයකු දරන උත්සාහය වඩාත් හොඳින් නිරූපණය වන්නේ කුමන සංකල්පය මගින් ද?

(1) අලෙවිකරණ සංකල්පය (2) සමාජීය අලෙවිකරණ සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) නිෂ්පාදිත සංකල්පය (5) නිෂ්පාදන සංකල්පය (……)

**24.** නිෂ්පාදිතයක් සම්බන්ධ පාරිභෝගික වටිනාකම් ධුරාවලියේ අංග පහත දැක්වේ.

A - හර ප්‍රතිලාභ
B - වැඩි දියුණු කළ නිෂ්පාදිත
C - මූලික නිෂ්පාදිත
D - අපේක්ෂිත නිෂ්පාදිත
E - විභව නිෂ්පාදිත

ඉහත සඳහන් පාරිභෝගික වටිනාකම් ධුරාවලිය නිවැරදිව අනුපිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) A, B, D, C, E (2) A, C, D, B, E (3) B, A, E, C, D
(4) B, E, A, C, D (5) C, A, B, D, E (……)

[ පස්වැනි පිටුව බලන්න.

**25.** ව්‍යාපාර ආයතනයක් විසින් ඉටු කරන ලද ප්‍රවර්ධන කාර්යයන් කිහිපයක් පහත දැක්වේ.

A - නිෂ්පාදිත පිළිබඳ විස්තර සැපයීම
B - ලොතරැයි ක්‍රම හඳුන්වා දීම
C - මිල අඩු කිරීම
D - ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය ලබා දීම
E - නිෂ්පාදන සාම්පල් ලබා දීම
F - වෙළෙඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම
G - මිල වට්ටම් හඳුන්වා දීම

ඉහත දැ අතුරෙන් විකුණුම් ප්‍රවර්ධනය සඳහා පමණක් අදාළ කාර්යයන් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, D, E, F (2) B, D, E. F (3) B, C, E, G (4) C, D, F, G (5) C, E, F, G (......)

**26.** සේවක ප්‍රවාසිතාවය යනුවෙන් අදහස් කරනුයේ සේවකයින්,
(1) රාජකාරි සඳහා වාර්තා නොකිරීමයි.
(2) සංවිධානය හැරයාමයි.
(3) රාජකාරි නිවාඩු ලබා ගැනීමයි.
(4) හිමිකම් ඇති නිවාඩු ලබා ගැනීමයි.
(5) උපදෙස් පිළිනොගැනීමයි. (......)

**27.** 'රැකියාස්ථ පුහුණුව' යන්නට අයත් **නොවන්නේ** කුමක් ද?
(1) ආධුනිකත්ව පුහුණුව (2) රැකියා භ්‍රමණය
(3) සීමාවාසික පුහුණුව (Internship) (4) සමාකරණය
(5) භූමිකා රංගනය (......)

**28.** විනය කළමනාකරණයේ වැදගත්කම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය තෝරන්න.
(1) සේවකයින් අතර මතභේද අවම කිරීම
(2) සේවකයින්ගේ ස්වයං විශ්වාසය වර්ධනය කිරීම
(3) සේවකයින් වෙත තීරණ දැන්වීම
(4) වෛද්‍ය රක්ෂණ වියදම් අඩුකර ගැනීම
(5) සේවක රැකියා සුරක්ෂිතතාවය තහවුරු කිරීම (......)

**29.** පහත වගුවේ තොරතුරු පද්ධති වර්ග හා ඒවාට අදාළ උදාහරණ දක්වා ඇත.

| තොරතුරු පද්ධති වර්ග | උදාහරණ |
|---|---|
| (i) ගනුදෙනු සැකසුම් පද්ධති (TPS) | A - පුරෝකථන වාර්තා ලබා දීම |
| (ii) කාර්යාල ස්වයංකරණ පද්ධති (OAS) | B - දෛනික තොග වාර්තා ලබා දීම |
| (iii) කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) | C - විද්‍යුත් තැපැල් පහසුකම් ලබා දීම |
| (iv) තීරණ උපකාරක පද්ධති (DSS) | D - වැටුප් වාර්තා සැකසීම |
| (v) විධායක උපකාරක පද්ධති (ESS) | E - ආයෝජන ඇගයීම් වාර්තා ලබා දීම |

ඉහත දී ඇති තොරතුරු පද්ධති වර්ග අනුපිළිවෙළ අනුව උදාහරණ නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) B, C, E, D, A (2) C, D, E, A, B (3) D, C, B, E, A
(4) D, E, A, B, C (5) E, A, B, C D (......)

**30.** ව්‍යාපාර සැලැස්ම පිළිබඳ මගපෙන්වීමක් ලබාදීම සඳහා පිළියෙල කරනු ලබන්නේ,
(1) විධායක සාරාංශයයි. (2) පිරිවැය සාරාංශයයි.
(3) මුදල් ප්‍රවාහ සාරාංශයයි. (4) ආදායම් සාරාංශයයි.
(5) ණය පිළිබඳ සාරාංශයයි. (......)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ලාභය අරමුණු කරගත් නමුත් ලියාපදිංචිය **අනිවාර්ය නොවන** ව්‍යාපාර සංවිධාන වර්ග දෙකක් වන්නේ ........................ සහ ........................ ව්‍යාපාරයන් ය.

(ආ) අභ්‍යන්තර මිල ස්ථායිතාව මගින් රජයට................................ සහ ................................ අනුපාතය පාලනය කළ හැක.

**32.** (අ) වරලත්ලාභියා විසින් දළ................................ වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස වරලත් හිමියා වෙත ගෙවිය යුතු වන්නේ ................................ වේ.

(ආ) ව්‍යවසායකයකු සාමාන්‍යයෙන් ................................ අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරන අතර, සමාජීය ව්‍යවසායකයකු ................................ අරමුණු කරගෙන ව්‍යාපාර ආරම්භ කරයි.

**33.** (අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ................................ සූක්ෂම වන හෙයින් පුද්ගලයන් සඳහා වඩාත් ................................ සැපයීමට හැකි වේ.

(ආ) පිටතට නැඹුරු වූ ප්‍රවාහන හා සැපයුම් සේවා (outbound logistics) ................................ ආරම්භ වී ................................ අවසන් වේ.

**34.** (අ) රේගු බන්දිත ගුදම් තුළ දී ආනයනය කළ භාණ්ඩ සඳහා වටිනාකමක් එකතු කිරීමෙන් පසුව අපනයනය කිරීම ................................ වෙළෙඳාම වන අතර ආනයනය කරන උපකරණ භාවිතයෙන් පසුව නැවත එම රට වෙත යැවීම ................................ අපනයනය වේ.

(ආ) විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා බැංකු ................................ හා ................................ ලිපිය යොදා ගත හැකි වේ.

**35.** (අ) කළමනාකරණයේ දී නිවැරදි දේ සිදු කිරීම ................................ වන අතර කළ යුතු දේ නිවැරදිව කිරීම ................................ වේ.

(ආ) මින්ස්බර්ග්ගේ භූමිකා වර්ගීකරණය අනුව කළමනාකරුවකු විසින් නව ව්‍යාපෘති හඳුන්වා දීම ................................ භූමිකාවෙහි ................................ උපභූමිකාවට අයත් වේ.

**36.** (අ) තාක්ෂණික කුසලතා ඉතා වැදගත් වනුයේ ................................ කළමනාකරුවන් හට වන අතර ................................ කුසලතා සියලු ම මට්ටමේ කළමනාකරුවන් හට එක සමානව වැදගත් වේ.

(ආ) සේවකයින් වෙත ................................ සහ ................................ විධිමත්ව පවරාදීමේ ක්‍රියාවලිය බලතල පැවරීම ලෙස හැඳින්වේ.

**37.** (අ) කාර්ය අභිමුඛ නායකයන් වඩාත් තම අවධානය යොමු කරනුයේ ................................ වන අතර ................................ නැඹුරු නායකයන් වඩාත් තම අවධානය යොමු කරනුයේ සේවකයින් වෙත ය.

(ආ) සේවක යෙදවුම් හා ................................ අතර සම්බන්ධතාව ................................ ඵලදායීතාව ලෙස හඳුන්වනු ලැබේ.

**38.** (අ) නිෂ්පාදකයකු විසින් එකම සන්නමක් යටතේ භාණ්ඩ පෙළක් ඉදිරිපත් කිරීම ................................ සන්නම ලෙස හඳුන්වන අතර නියමිත වෙළෙන්දෙකු වෙනුවෙන් සන්නමක් නිර්මාණය කිරීම................................ සන්නම ලෙස හැඳින්වේ.

(ආ) ඉලක්ක ඉපයීම මත මිල කිරීමේ දී ................................ පදනම් වන අතර පවත්නා මිල මත මිල කිරීමේ දී ................................ පදනම් වේ.

**39.** (අ) දිගුකාලීන මූල්‍ය තීරණ ................................ ව්‍යුහය හා ................................ පිළිබඳ තීරණ ලෙස වර්ග කළ හැක.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක ඇතුළත් ක්‍රියාකාරකම් මූලිකව ................................ හා ................................ වශයෙන් වර්ග කළ හැක.

**40.** (අ) අභ්‍යන්තර ආකර්ෂණ ක්‍රම දෙකක් ලෙස ................................ හඳුන්වාදීම සහ ................................ සැලැස්ම භාවිත කළ හැක.

(ආ) නවක සේවකයින් සමාජගත කිරීමේ ක්‍රියාවලිය ................................ වන අතර ඔවුන්ගේ සේවාව ස්ථිර කිරීම දක්වා කාලපරිච්ඡේදය ................................ කාලය වේ.

[ හත්වැනි පිටුව බලන්න.

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** වෙළෙඳ ක්‍රියාකාරකම් සඳහා අතරමැදියන් භාවිත කිරීමේ වාසි සහ අවාසි **දෙක** බැගින් දක්වන්න.

| වාසි | අවාසි |
|---|---|
| 1. | 1. |
| 2. | 2. |

**42.** ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අරමුණු **හතරක්** සඳහන් කරන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

**43.** ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** ලියන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

**44.** ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂ බැංකු සඳහා නිදසුන් **හතරක්** ලියන්න.

1. ............................................... 2. ...............................................

3. ............................................... 4. ...............................................

**45.** අපද්‍රව්‍ය කළමනාකරණයේ 4 R අංග **හතර** නම් කරන්න.

1. ............................................... 2. ...............................................

3. ............................................... 4. ...............................................

**46.** විමධ්‍යගත කිරීම මගින් සංවිධානයකට ලබාගත හැකි වාසි **හතරක්** සඳහන් කරන්න.

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................

**47.** තොග පාලනය හා සම්බන්ධ පහත සමීකරණයෙහි අඩංගු අක්ෂර මගින් අදහස් කරන්නේ කුමක් ද?

$$EOQ = \sqrt{\frac{2cd}{h}}$$

1. $EOQ$ : ..............................................................................................................
2. $c$ : ..............................................................................................................
3. $d$ : ..............................................................................................................
4. $h$ : ..............................................................................................................


**48.** නව සේවකයකු තෝරාගැනීමේ දී සංවිධානයකට භාවිත කළ හැකි පසුබිම් පරීක්ෂණ වර්ග **හතරක්** සඳහන් කරන්න.


1. ..................................................................................................................
2. ..................................................................................................................
3. ..................................................................................................................
4. ..................................................................................................................

**49.** දත්ත සැලසුම් ක්‍රියාවලියට අයත් කාර්යයන් **හතරක්** දක්වන්න.

1. ..................................................................................................................
2. ..................................................................................................................
3. ..................................................................................................................
4. ..................................................................................................................

**50.** පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

1.  ..................................................................................

2.  ..................................................................................

3.  ..................................................................................

4.  ..................................................................................

* * *

42933



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

2019.08.13 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** අනුෂා ජංගම දුරකථන සිල්ලරව අලෙවි කරන අතරම නව මාදිලියේ දුරකථන කවර (phone cover) නිර්මාණ කරන්නියක් ද වේ. නිර්මාණකරණය පිළිබඳව ඇය සතුව මනා දැනුමක් හා පලපුරුද්දක් වේ. ඇය තම අලෙවිය සහ ලාභය වර්ධනය කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් එම දුරකථන කවර සඳහා පහළ මිලක් නියම කරනු ලබයි. 2019 වර්ෂයේ මැද භාගය තුළ ඇගේ කවර විකුණුම් ප්‍රමාණය ඒකක 50 000 කට ළඟා වූ අතර ඒකක 20 000 විකුණා ඇත්තේ මංගත (online) ක්‍රමය තුළිනි. අනුෂා තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමේ උපායමාර්ග හඳුනාගැනීම සඳහා SWOT (ශ.දු.අ.ත) විශ්ලේෂණයෙහි යෙදෙමින් සිටියි.

(i) (අ) ඉහත සිද්ධි අධ්‍යයනයෙහි ඇතුළත් ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් දෙක විස්තර කරන්න.
(ආ) ඉහත ව්‍යාපාරයේ ප්‍රධාන අරමුණු දෙක මොනවා ද? (ලකුණු 04 යි)

(ii) දුරකථන කවර සඳහා ඉහළ පිරිවැටුමක් ඇති වීම කෙරෙහි බලපෑ හැකි සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) මංගත වෙළෙඳාම තුළින් අනුෂාට ලබා ගත හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර සඳහා SWOT විශ්ලේෂණය නිසා ඇති වන වාසි **හතරක්** දක්වන්න.
(ආ) දුරකථන කවර කර්මාන්තය සඳහා පොදුවේ ඇති අවස්ථා **දෙකක්** හා තර්ජන **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) අනුෂා සතුව ඇති ශක්තීන් **දෙකක්** සඳහන් කර, ඒවා ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධනයට කෙසේ යොදාගත හැකි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

**2.** (i) කළමනාකරුවකු විසින් ප්‍රකාශ කරන ලද්දේ සමාගමේ අරමුණු හා සමාගම කෙරෙහි උනන්දුවන පාර්ශ්වයන්ගේ අරමුණු අතර ගැටුම්කාරී බව කළමනාකරුවන් හට අභියෝගයක් බවයි. සමාගමක අරමුණු සහ කොටස්කරුවන්ගේ අරමුණු උදාහරණ ලෙස ගනිමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'තිරසර සංවර්ධනය' යන්න පැහැදිලි කරන්න.
(ආ) ව්‍යාපාරික සංවිධානයකට තම පාරිභෝගිකයින් කෙරෙහි ඇති සමාජ වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාර සංවිධානයකට ලබා ගත හැකි ප්‍රතිලාභ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

[ දෙවැනි පිටුව බලන්න.

(iv) (අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන වෙත ලබා දෙන සේවා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රතිපත්තිමය පොලී අනුපාත වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. (i) බේකරි නිෂ්පාදනයට අවශ්‍ය යෙදවුම් මිල ඉහළ යාම නිසා බේකරි හිමියකු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා අතිරේක ප්‍රාග්ධනය සපයා ගැනීමට තීරණය කරන ලදී. මෙම තීරණයෙහි ඇති වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) සිරිමලී විසින් තම ප්‍රදේශයෙන් බහුලව ලබාගත හැකි කෙසෙල් කෙඳි භාවිත කර කාන්තා අත් බෑග්, හිස්වැසුම් හා වෙනත් විසිතුරු නිර්මාණ නිපදවීමේ ආයතනයක් රු. 50 000ක මුදලක් ආයෝජනය කර ආරම්භ කරන ලදී. ඇය විසින් තම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් තිදෙනකුට එම නිෂ්පාදන පිළිබඳ පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව දෛනිකව රු. 800 බැගින් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගන්නා ලදී. එසේ ම තම නිෂ්පාදන සංචාරක හෝටල් තුළ අලෙවි කිරීමට ද කටයුතු සිදු කරන ලදී. මෙම සිද්ධිය තුළ ඇති සමාජීය හා ආර්ථික ප්‍රතිලාභ මොනවා දැයි දක්වන්න. (ලකුණු 04 යි)

(iii) විශාල ආයතනයක් වීමෙන් ලැබෙන ප්‍රතිලාභ නොසලකා හරිමින් ඇතැම් ආයතන කුඩා ව්‍යාපාර ලෙසටම පවත්වා ගැනීමට අදහස් කරන්නේ ඇයි දැයි දැක්වීමට හේතු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'ක්ෂණික ප්‍රතිචාර කේත' (Quick Response Code) භාවිතය මගින් ව්‍යාපාරිකයකුට ලබා ගත හැකි වාසි **දෙකක්** දක්වන්න.

(ආ) විද්‍යුත් මුදල් පසුම්බිය (e-wallet) භාවිත කර ජංගම දුරකථනයකින් ගනුදෙනු සඳහා මුදල් ගෙවීමේ දී පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු මූලික කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)

(v) (අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවක ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න.

(ආ) රාජ්‍ය සංස්ථාවක් රාජ්‍ය දෙපාර්තමේන්තුවකින් වෙන් කර හඳුනා ගත හැකි ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) විධිමත් හා අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලින් මුදල් ලබාගෙන තම ප්‍රදේශයේ කිරි නිෂ්පාදන මිලට ගෙන විකිණීමේ ආයතනයක් ආරම්භ කිරීමට ලක්ෂ්මී අදහස් කර සිටියි. අවිධිමත් මූල්‍ය සම්පාදන මාර්ගවලට වඩා විධිමත් මූල්‍ය සම්පාදන මාර්ග තුළින් ලක්ෂ්මීට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'ධාරක චෙක්පත්', 'විධාන චෙක්පත්' හා සසඳන්න.

(ආ) 'සේව්‍ය වගකීම් රක්ෂණය' යන්න විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ දුම්රිය ප්‍රවාහන සේවයේ ඇති දුර්වලතා **හතරක්** සඳහන් කර, එම දුර්වලතා මගහරවා ගැනීමට විසඳුම් යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය වැදගත් වන ආකාර **හතරක්** සඳහන් කරන්න.

(ආ) වාචිකව පණිවුඩයක් සන්නිවේදනය කිරීමේ දී එම පණිවුඩය වෙනස් වීම කෙරෙහි බලපාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)


(v) (අ) 'සාපේක්ෂ පිරිවැය වාසිය' යන්න විස්තර කරන්න.

(ආ) 'විද්‍යුත් ගෙවීම් ක්‍රම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** (i) පහත දැක්වෙන්නේ සංවිධාන සටහනක කොටසකි.




(අ) 'සංවිධාන ව්‍යුහය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) 'පාලන අවකාශය' යන්න පැහැදිලි කරමින් ඉහත දී ඇති සංවිධාන සටහන අනුව අලෙවි කළමනාකරුගේ පාලන අවකාශයේ තරම දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'සහගාමී පාලනය' සහ 'පසු පෝෂණ පාලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාර සංවිධානයකට පර්යේෂණය හා සංවර්ධනය වැදගත් වීමට හේතු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත දැක්වෙන්නේ X Y සමාගමේ තොරතුරු කිහිපයකි.

| | අයවැයගත (රු.) | සත්‍ය (රු.) |
|---|---|---|
| විකුණුම් ආදායම | 3 000 | 2 750 |
| විකුණුම් පිරිවැය | 2 100 | 12 700 |

(අ) විකුණුම් ආදායම් විචලනය හා විකුණුම් පිරිවැය විචලනය ගණනය කරන්න.


(ආ) විකුණුම් ආදායම් විචලනය විය හැකි හේතු **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) "මෝටර් රථ නිෂ්පාදනයේ දී වැඩි වශයෙන් යොදාගනුයේ ප්‍රවාහ නිෂ්පාදන ක්‍රමයයි." මෙම ක්‍රමය මෝටර් රථ නිෂ්පාදනය සඳහා භාවිත කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කර, ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) 'ක්‍රියාවලි පිරියත', 'නිෂ්පාදන පිරියත' හා සසඳන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) XYZ සමාගමේ රූපවාහිනී යන්ත්‍රවල තොග මට්ටම් පිළිබඳව ප්‍රස්තාර සටහනක් පහත දැක්වේ.




පහත දෑ ගණනය කරන්න.

(අ) චක්‍රීය කාලය

(ආ) යළි ඇණවුම් ප්‍රමාණය

(ඉ) ආරක්ෂිත තොගය

(ඊ) පොරොත්තු කාලය (ලකුණු 04 යි)

(ii) ද්‍රව්‍ය ඵලදායීතාවය වර්ධනය කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'වෙළෙඳපොළ ඛණ්ඩනය' යනු කුමක් ද?

(ආ) වෙළෙඳපොළ ඛණ්ඩනය විකුණුම් වර්ධනයට උදව් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) 'පාරිභෝගික වටිනාකම' හා 'පාරිභෝගික තෘප්තිය' අතර ඇති සම්බන්ධතාවය විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'භාණ්ඩයක ජීවන චක්‍රය' (PLC) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) නිෂ්පාදකයකුට භාණ්ඩයක ජීවන චක්‍රය අවබෝධ කර ගැනීම තුළින් ලැබිය හැකි වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

7. (i) ව්‍යාපාර සංවිධානයක බාහිර මූල්‍ය සම්පාදන මාර්ග **දෙකක්** හා ඒවායේ සීමා **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරික තීරණ කෙරෙහි ද්‍රවශීලතා අනුපාතවල වැදගත්කම විස්තර කරන්න.

(ආ) සමාගමක කොටස් මිල වැඩි වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) දත්ත, තොරතුරු හා සංසන්දනය කරන්න.

(ආ) 'දැනුම් සේවකයින්' යන්න පැහැදිලි කර, එවැනි සේවකයින් සඳහා උදාහරණ **දෙකක්** සපයන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'රැකියා විස්තරය' හා 'රැකියා පිරිවිතරය' අතර වෙනස්කම් **දෙකක්** දක්වන්න.

(ආ) සේවකයින් වෘත්තීය සමිතිවල සාමාජිකත්වය ලබා ගැනීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ආයතනයකට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කිරීමට තීරණය කරන ලදී. මෙසේ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්කරුවන් ආකර්ශනය කර ගැනීමේ ඇති වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) "සම්මුඛ පරීක්ෂණ ක්‍රමය සේවකයින් තෝරාගැනීම සඳහා භාවිත කරන ජනප්‍රිය ක්‍රමයකි." මෙම ක්‍රමයේ ඇති සීමා **දෙකක්** විස්තර කරන්න.

(ආ) පරිවාස කාලය තුළ තමන් වෙත පවරන ලද රාජකාරි හා වගකීම් ඉටු කිරීමට අපොහොසත් සේවකයකුට විරුද්ධව කළමනාකරණයට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) සංවිධානයක මුදල් ගලා යාම් පාලනය කළ හැකි ආකාර **හතරක්** යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සංවිධානයක් සඳහා තොරතුරු කළමනාකරණයේ ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරිකයකුට ව්‍යාපාර සැලැස්මක් වැදගත් වීමට හේතු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) අලෙවි සැලැස්මක ඇතුළත් විය යුතු මූලිකාංග පැහැදිලි කරන්න.

(ආ) තරගකාරිත්ව විශ්ලේෂණයේ දී අවධානය යොමු කළ යුතු සාධක **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය තුළ අඩංගු වන 'මෙහෙයුම් පෙර වියදම්' යන්න පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *